*සැ. යු.*– 2007.06.29 දින පළ කරන ලද අංක 1,504 දරන *ගැසට් පත්‍රයේ* II කොටස පළ නොකරන ලදී.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,505— 2007 ජූලි 06 වැනි සිකුරාදා — 2007.07.06**

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| තනතුරු - ඇබෑර්තු … … … … | 662 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය … … … … | 667 |


*සැ. යු.*–(i) අධිකරණ සංවිධාන (සංශෝධන) පනත කෙටුම්පත 2007 මැයි මස 18 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) ශ්‍රී ලංකා මුස්ලිම් කවුන්සලය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2007 ජුනි මස 15 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(iii) සමන්තුරේ තබ්ලීකුල් ඉස්ලාම් අරාබි විද්‍යාලය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2007 ජුනි මස 08 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2007 ජූලි මස 13 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2007 ජුනි මස 29 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන**,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.


659 -B 079519- 9,400 (2007/07)
B1-

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සැම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතුය. (1961 ජනවාරි මස 1 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිළධාරීන් විෂයෙහි මෙම නියමය අදාළ නොවන්නේය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලකදී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණ සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලුම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තාහ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලෙස රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

2.3 දිවයිනේ ඕනෑම තැනක සේවය කිරීමට රාජ්‍ය නිළධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි :

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිළධාරිහු පූර්වෝක්ත 2 වන වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලටද යටත් විය යුත්තාහ.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලුම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලුම රාජ්‍ය නිලධාරිහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථාද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේදී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීනතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකිය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාල සීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැළසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරීවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත් වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාල සීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකිය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නාවූද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි :

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යයි ආණ්ඩුව විසින් නියම කරනු ලබන ප්‍රතිශතක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නාවූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිණු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නාවූ නිලධාරීන් හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිණු ලැබූ යුද්ධ, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවල යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාල සීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව ඇත්ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතුය.

5. යුද්ධ සේවා අනුග්‍රහය :

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත හටයින්ද, සහය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයටද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම්ද ඔවුන් මෙම හමුදාවන්ට බැදී ඇත්තේ 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම්ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම්ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 3 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනිදා දක්වා වූ කාල සීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිළධාරීහු :

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නා වූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ, දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නාවූද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකිද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතුය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතුය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුවද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත් තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින්ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙහි අර්ථ දැක්වීම :

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90 (1) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 දින සිට සිදුකෙරෙනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධි විධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියළුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලුම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ.

- i. මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම හෝ තහනම් කිරීම.
- ii. විභාගයේ එක් විෂයයකට හෝ මුලු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම.
- iii. එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
- iv. මුළු ජීවිත කාලයේම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
- v. සහතික පත්‍රය යම් කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.
- vi. විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වග කිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේය.

1. සියළුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසළදීත් විභාගශාලාධිපතින්ටද, ඔහුගේ සහාකාරයින්ටද, අනිකුත් විභාගාපේක්ෂකයින්ටද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතින්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුලු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාගශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීම් ආදියක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාගශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සළකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමටද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැළකිය හැකිවේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතුය. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේදී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම්ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමක් චිත්‍ර කර්මයේදී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සළකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේදී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැළකීමට හේතු වනවා ඇත.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොල හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හෝ ජ්‍යාමිතික උපකරණ පෙට්ටි අවශ්‍ය අවස්ථාවලදී ඒවා හැර අන්‍ය අත් බෑග්, පසුම්බි පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැමූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ තමා සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොත පතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම්ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සළකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොලයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම හොර උත්තර ලිවීමටද යත්න දැරීම තහනම්ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම් කරුවෙකුට උදව්දීමෙන්ද, වෙන අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබාගැනීමෙන්ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසි යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් වි භාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකුටම ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂකත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේදී පිළිතුරු ලියන විට හෝ විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකයේ වෙනස් කිරීමක් එබඳු වරදවල්ය. විභාගාපේක්ෂකයින් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසියම් අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සළකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය :

i. විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කළින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10 කට හෝ 15 කට කළින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට වි භාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

ii. යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇතිවූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතින්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගුවී යාමට හේතු විය හැකිය.

iii. විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේදී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතින්ට දන්වා විභාග අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

iv. විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම්, ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මොස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේදී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

v. විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රේදි කෑළි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

vi. තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිවද පිරිසිදුවද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තැබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිය යුතුයි.

vii. උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහාය. දකුණු පැත්තේ තීරය වෙන් කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

viii. අනිවාර්ය ප්‍රශ්නද, තෝරා ගත යුතු අන් ප්‍රශ්නද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

ix. ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව සෑහෙන පමණ විශාලවද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවලදීත් ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

x. එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන්වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

xi. ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතින්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩිවී සිටිය යුතුය. මෙසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමටද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සළකණු ලැබීමටද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

xii. යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විටද කඩදාසි ආදිය අවශ්‍ය වූ විටද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවි ය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

# තනතුරු – ඇබෑර්තු

## ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි නඩත්තු නිලධාරී (ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II "ආ" ඛණ්ඩයේ) තනතුරට බඳවා ගැනීම්

ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි නඩත්තු නිලධාරී ශ්‍රී ලංකා තක්ෂණ සේවයේ II "ආ" ඛණ්ඩයේ තනතුර සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *සාමාන්‍ය සුදුසුකම්* :

(i) වයස අවු. 18ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතුය. (රාජ්‍ය සේවයේ නියුතු වූවන් සඳහා උපරිම වයස් සීමාව බලපානු නොලැබේ).

(ii) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

(iii) රාජකාරී අවශ්‍යතාව මත දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට එකඟ විය යුතුය.

02. *අධ්‍යාපන සුදුසුකම්.*– භාෂාව හෝ සාහිත්‍ය, අංක ගණිතය/ ගණිතය ඇතුළු විෂයයන් 06කින් සම්මාන සාමාර්ථ 04ක් සහිතව අ. පො. ස. (සා. පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත්වීම හෝ සමාන විභාගයකින් සමත්වීම.

03. *වෘත්තීය සුදුසුකම්* :

(i) මොරටුව විශ්ව විද්‍යාලයේ හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණ ඩිප්ලෝමා (සිවිල්)

හෝ

(ii) ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු විද්‍යා ඩිප්ලෝමාව (සිවිල්)

හෝ

iii. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු විද්‍යා ඩිප්ලෝමාව (සිවිල්)

හෝ

(iv) විවෘත විශ්ව විද්‍යාලය මගින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව

හෝ

(v) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය මගින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ පළමුවන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම

හෝ

(vi) ඉහත තාක්ෂණික සුදුසුකම්වලට සමාන ශ්‍රී ලංකා තාක්ෂණ සේවා මණ්ඩලය මගින් පිළිගනු ලබන වෙනත් සුදුසුකම්.

04. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි.*- මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ.

05. *සේවා කොන්දේසි.*– ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 10-12 දක්වා වගන්ති අදාල වේ.

06. *වැටුප් පරිමාණය* :

ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I පන්තිය, II "අ" ඛණ්ඩය හා II "ආ" ඛණ්ඩයට නියමිත වැටුප් පරිමානය

මාසික රු. 14,140-10x140-11 x 150-6 x 210-14 x 290-රු. 22,510 (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 හි MT 2-2006 අනුව වැටුප් පරිමාණය)

තනතුරට පත් වී වසර තුනක් ඇතුලත පළමු කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය.

07. *බඳවා ගැනීමේ ක්‍රමය.*– රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 15/90 යටතේ තාක්ෂණ සේවා මණ්ඩලයේ අධීක්ෂණය යටතේ පැවැත්වෙන තරග විභාගයක ප්‍රතිඵල මත තනතුරට බඳවා ගනු ලැබේ. විභාගය පැවැත්වෙන දිනය හා විභාග පරිපාටිය දැනුම් දෙනු ලැබේ.

08. *ඉල්ලුම් කළ යුතු ආකාරය* :

8.1 මෙම නිවේදනයේ දැක්වෙන ආදර්ශ ආකෘතිය පරිදි 4ඒ ප්‍රමාණයේ කඩදාසියක සකස් කරන ලද අයදුම්පත් 2007 ජූලි මස 27 දිනට පෙර ලැබෙන සේ අධ්‍යක්ෂ, ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව, අංක 07, රීඩ් මාවත, කොළඹ 07 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙලවරේ "ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II "ආ" "ගොඩනැගිලි නඩත්තු නිලධාරී" තනතුරට බඳවා ගැනීම යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය. (දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් ඉල්ලුම්පත් තම සේවා ප්‍රධානියා මගින් එවිය යුතුය.)

8.2 රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකරුවෙකු, පූජ්‍ය ස්ථානයක් භාර පූජකවරයෙකු, නීතිඥයෙක් හෝ රු. 94,080 නොඅඩු වාර්ෂික වැටුපක් ලබන රජයේ නිලධාරියෙකු විසින් අපේක්ෂකයාගේ අත්සන සහතික කළ යුතුය.

8.3 සෑම අයුරකින්ම සම්පූර්ණ නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් ලැබුණු බව හෝ ප්‍රතික්ෂේප කළ බව දන්වා එවනු නොලැබේ.

8.4 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2007 ජූලි මස 27 දින වේ.

09. *සාවද්‍ය තොරතුරු සැපයීම.*– යම් අපේක්ෂකයෙකු සුදුසුකම් නොමැති බව පත්වීම ලැබීමට පෙර ඕනෑම අවස්ථාවක දී අනාවරණය වුවහොත් අපේක්ෂකත්වය අවලංගු කෙරෙනු ඇත. පත්වීම් ලැබීමෙන් පසු දැන දැනම සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑකමින් යටපත් කර ඇති බව හෝ අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවාම සේවයෙන් පහ කෙරෙනු ඇත.

10. අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අදාල කරුණු හෝ මෙම නිවේදනයෙන් අනාවරණය නොවුන වෙනත් කරුණු සම්බන්ධව ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂගේ තීරණය අවසාන තීරණය වේ.

ආචාර්ය සරෝජා වෙත්තසිංහ,
ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ.

2007 ජුනි මස 19 වැනි දින,
ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව,
අංක 07,
රීඩ් මාවත,
කොළඹ 07.

## ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි නඩත්තු නිලධාරී (ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ **II "ආ"** ඛණ්ඩයේ) තනතුරට බඳවා ගැනීමේ අයදුම්පත්‍රය

01. (i) මුලකුරු සමග නම :——————.
(ii) මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————.

02. (i) ස්ථිර පදිංචි ස්ථානයේ ලිපිනය :——————.
දුරකතන අංකය :——————.

(ii) දැනට පදිංචි ස්ථානයේ ලිපිනය :——————.
දුරකතන අංකය :——————.
(iii) කාර්යාලීය ලිපිනය :——————.
දුරකථන අංකය :——————.

03. ජාතික හැඳුනුම්පත් අංකය :——————.

04. උපන් දිනය : අවු.:————— මාස:—————. දින:——————.

05. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :
අවු.:——————. මාස:——————. දින:——————.

06. ස්ත්‍රී/පුරුෂ භාවය :——————.

07. විවාහක/අවිවාහක බව :——————.

08. *අධ්‍යාපන සුදුසුකම් :*

i. අ. පො. ස. (සා. පෙළ) විභාගය:

වර්ෂය :————. මාධ්‍ය:————. විභාග අංකය:————.
විෂයය ශ්‍රේණිය
...................... ......................... ............................

ii. අ. පො. ස. (උ. පෙල) විභාගය:

වර්ෂය:————. මාධ්‍ය:————.විභාග අංකය:————.
විෂයය ශ්‍රේණිය
............................. ........................... ...........................

09. *වෘත්තීය හා වෙනත් සුදුසුකම් :*

(i) හදාරා ඇති පාඨමාලාවන් පිළිබඳ විස්තර:

| *පාඨමාලාව හදාරා ඇති ආයතනයේ නම* | *කාලය සිට - දක්වා* | *හැදෑරූ පාඨමාලාව* | *ලැබූ සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

(ii) *වෙනත් සුදුසුකම් පිළිබඳ විස්තර :*

10. ඔබ උසාවිය ඉදිරියේ කිසියම් චෝදනාවකට වරදකරු වී ඇද්ද ?
ඔව්/නැත.
ඔව් නම් විස්තර සපයන්න:————.

11. *අයදුම්කරුගේ සහතිකය:*

(i) මෙම අයදුම්පතේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව අවංකව ම ප්‍රකාශ කරමි.

(ii) මා විසින් කරනු ලැබූ මෙම ප්‍රකාශය මා සේවයට බඳවා ගැනීමට පෙර අසත්‍ය බව ඔප්පු වුවහොත් නුසුදුස්සෙකු වන බව හා පත්වීම් ලැබීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවාම සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව මම දැන සිටිමි.

—————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

12. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

ඉහත අත්සන් කර ඇති .................... මයා/මෙය/මිය හා හොඳින් දන්නා හඳුනන බවත් ඔහු/ඇය මා ඉදිරිපිට දී අත්සන් යෙදූ බවත් මෙයින් සහතික කරමි.

නම :—————.
නිල නාමය :—————.
ලිපිනය :—————.
දිනය :—————.

—————.
අත්සන හා නිල මුද්‍රාව

13. *දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය (රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන්ට පමණයි):*

මෙම ඉල්ලුම්කරු වන ................................................මහතා/මිය/මෙය .............................................දින සිට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ සේවය කරනු ලබයි. ඔහු/ඇය ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත/තාවකාලික/අනියම් ....................................................තනතුර දරයි. පසුගිය වසර 05ක කාලය තුල වේතනාධික සියල්ල උපයාගෙන ඇත. ඔහුගේ/ඇයගේ වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායකය. ඔහු/ඇය මොනයම් හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම හැර) යටත් කොට නොමැති බව සහතික කරමි. තව ද ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් දැනට දරන තනතුරින් නිදහස් කළ හැකිය/නොහැකිය.

—————.
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :—————.
පදවි නාමය :—————.
දෙපාර්තමේන්තුව/ආයතනය :—————.
දිනය :—————.

07-48/1

---

## ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ වඩු ශිල්පී (11 පංතිය) තනතුරට බඳවා ගැනීම

ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ වඩු ශිල්පී (11 පංතිය) තනතුර සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි.–* මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්වේ.

03. *සේවා කොන්දේසි.–* ආයතන සංග්‍රහයේ 11 පරිච්ඡේදයේ 10-12 වගන්ති අදාල වේ.

04. *වැටුප් පරිමාණය :*

මාසික 12,140-10 x 110 - 10 x 120 10 x 130 x 12 x 140 රු.17,420 (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 හි PL 2 - 2006 අනුව).

තනතුරට පත්වී වසර 03ක් ඉක්මවීමට පෙර කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුතුය.

05. *සාමාන්‍ය සුදුසුකම්* :

(i) වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය (දැනට රාජ්‍ය සේවයේ නියුතු වූවන් සඳහා උපරිම වයස් සීමාව බලපානු නොලැබේ).

(ii) විශිෂ්ඨ චරිතයකින් මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

(iii) රාජකාරි අවශ්‍යතාවය මත දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට එකඟ විය යුතුයි.

06. *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* :

(i) අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත පාසලකින් 8 වන ශ්‍රේණිය (9 වසර) සමත් විය යුතුයි.

(ii) 1/32 පරිමාණයෙන් කියවීමට හැකියාව තිබිය යුතුයි.

07. *වෘත්තීය සුදුසුකම්:*

වඩු කාර්මික ශිල්පය පිළිබඳ කාර්මික විද්‍යාලය, ජාතික ආධුනිකත්ව මණ්ඩලය හෝ ජාතික පුහුණු අධිකාරිය වැනි රජය පිළිගත් ආයතනයක මාස 06ක් හෝ ඊට වැඩි පුහුණුවක්.

08. *බඳවා ගැනීමේ ක්‍රමය:*

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 15/90 යටතේ ප්‍රායෝගික පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරා ගනු ලැබේ.

*විෂය නිර්දේශය* :

(i) වඩු කර්මාන්තයේ භාවිතාවන ආයුධවලින් වැඩ කිරීම පිළිබඳ හැකියාව පරීක්ෂා කිරීම.

(ii) සරල පිරිද්දුම හඳුනා ගැනීම හා සෑදීම.

(iii) සරල ඇඳීම් කියවීම් හා නිර්මාණ කිරීම (සිංහල දෙමළ හා ඉංග්‍රීසි භාෂා වලින් පවත්වන මෙය පැය 06 ක ප්‍රායෝගික පරීක්ෂණයකි).

09. *ඉල්ලුම් කළ යුතු ආකාරය* :

මෙම නිවේදනයේ ආදර්ශ ආකෘතිය පරිදි ඒ4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කරන ලද අයදුම්පත් 2007 ජූලි මස 27 දිනට පෙර ලැබෙන සේ ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ, ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව, අංක 07, රීඩ් මාවත, කොළඹ 07 යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. අයදුම්පත බහා එවන කවරයේ වම්පස ඉහළ කෙලවරේ "වඩු ශිල්පී (II පංතිය) තනතුරට බඳවා ගැනීම" යනුවෙන් පැහැදිලිව සඳහන් කළයුතුය.

(දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් ඉල්ලුම්පත් තම සේවා ප්‍රධානියා මඟින් එවිය යුතුය.).

රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, පූජ්‍ය ස්ථානයක් භාර පූජකවරයෙකු, නීතිඥයකු හෝ රු. 94,080 ට නොඅඩු වාර්ෂික වැටුපක් ලබන රජයේ නිලධාරියෙකු විසින් අපේක්ෂකයාගේ අත්සන සහතික කළ යුතුය.

සෑම අයුරකින්ම සම්පූර්ණ නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර අයදුම්පත් ලැබුණු බව හෝ ප්‍රතික්ෂේප කළ බව දන්වා එවනු නොලැබේ.

(iv) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2007 ජූලි මස 27 දින වේ.

10. *සත්‍ය තොරතුරු සැපයීම.–*

යම් අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව පත්වීම ලැබීමට පෙර ඕනෑම අවස්ථාවක දී අනාවරණය වුවහොත් අපේක්ෂකත්වය අවලංගු කෙරෙනු ඇත. පත්වීම ලැබීමෙන් පසු දැන දැනම සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑකමින් ම යටපත් කර ඇති බව හෝ අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවාම සේවයෙන් පහ කරනු ලැබේ.

11. අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අදාල කරුණු හෝ මෙම නිවේදනයේ අනාවරණය නොවන වෙනත් කරුණු සම්බන්ධව ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂකගේ තීරණය අවසාන තීරණය වේ.

ආචාර්ය සරෝජා වෙත්තසිංහ,
ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ.

ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව,
අංක 07, රීඩ් මාවත,
කොළඹ 07.

### ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව

### *වඩු ශිල්පී 11 තනතුර සඳහා අයදුම්පත්‍රය*

01. මුලකුරු සමග නම :——————.

02. මුලකුරුවලින් හැඳින්වෙන නම :——————.

03. පෞද්ගලික ලිපිනය :——————.

04. රාජකාරි ලිපිනය :——————.

05. දැනට පදිංචි ලිපිනය හා දිස්ත්‍රික්කය :——————.

06. (i) උපන් දිනය: අවුරුද්ද :————.මාසය:————.දිනය:————

(ii) ඉල්ලුම්පත් භාර ගන්නා දිනට වයස :

අවුරුදු :————.මාස :——————.දින :—————.

07. උපන් ස්ථානය :——————.

ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද යන වග :——————.

08. ස්ත්‍රී/පුරුෂ භාවය :——————.

09. විවාහක/අවිවාහක බව :——————.

10. (i) අධ්‍යාපන සුදුසුකම්:——————.

(ii) වෘත්තීය සුදුසුකම්:

| *ආයතනයේ නම* | *කාලය සිට දක්වා* | *හැදෑරූ පාඨමාලාව හා සාමාර්ථය* |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

11. මීට කලින් රජයේ යම් කිසි දෙපාර්තමේන්තුවක හෝ රජයේ සංස්ථාවක සේවය කලේ නම් එයින් අස්වීමට හේතු :——————.

12. යම්කිසි සාපරාධී වරදකට සෙදිනක හෝ උසාවියක දී වරදකරු වී ඇත්නම් එම වරද හා ලැබූ දඬුවම පිළිබඳ විස්තර :——————.

13. වෙනත් විස්තර :——————.

මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන් කරන විස්තර සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බව තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත් වන බවත් පත් කිරීමෙන් පසු අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

——————.
අයදුම්කරුගේ අත්සන

දිනය :——————.

14. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම

ඉහත අත්සන් කර ඇති ........................... මයා/මිය/මෙනවිය මා හොඳින් දන්නා හඳුනන බවත් ඔහු/ඇය මා ඉදිරිපිටදී අත්සන් යෙදූ බවත් මෙයින් සහතික කරමි.

නම :——————.
නිල මුද්‍රාව :——————.
ලිපිනය :——————.
දිනය :——————.

................................................ ගේ ඉල්ලුම්පත ඉදිරිපත් කරමි. ඔහු/ඇය මෙම ආයතනයේ/දෙපාර්තමේන්තුවේ ස්ථිර/තාවකාලික/අනියම් සේවයේ ....................................... වශයෙන් සේවය කරන බවත්, මේ තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් ඔහුව/ඇයව සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් දන්වමි.

——————.
ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව

අත්සන :——————. දිනය :——————.
නිලමුද්‍රාව :——————. ආයතනය :——————.

15. අයදුම්පත් රාජ්‍ය සේවයේ නියුක්ත අයෙකු නම් දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය.

07-48/2

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ උප්පැන්න, මරණ සහ විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු

### මහනුවර දිස්ත්‍රික්කය - අවලංගු කිරීම

ම විසින් පලකරන ලද මහනුවර දිස්ත්‍රික්කයේ පහත සඳහන් කොට්ඨාශවල උප්පැන්න මරණ සහ විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවීමේ නිවේදනවල සඳහන් අයදුම්පත් කැඳවීම නව බඳවා ගැනීමේ පරිපාටි ක්‍රියාත්මක කිරීම සඳහා මෙයින් අවලංගු කරමි.

එල්. කේ. රත්නසිරි,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2007 ජූනි මස 07 වැනි දින,
කොළඹ 11, කෙළින් වීදිය, අංක 280
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය* | *ඉල්ලුම්පත් කැඳවූ කොට්ඨාශය සහ තනතුර* | *ගැසට් පත්‍රයේ අංකය සහ දිනය* |
|---|---|---|---|
| මහනුවර | උඩපලාත | උඩපලාත කොට්ඨාශයේ දුනුකේඋල්ල ප්‍රදේශයේ අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | 1451 සහ 2006.06.23 |
| මහනුවර | කඩවත් සතර සහ ගඟවට කෝරළය | ගඟවට කෝරළය කොට්ඨාශයේ ගැටඹේ ප්‍රදේශයේ අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | 1451 සහ 2006.06.23 |
| මහනුවර | පන්විල | පාතදුම්බර කොට්ඨාශයේ පන්විල ප්‍රදේශයේ අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | 1451 සහ 2006.06.23 |
| මහනුවර | තුම්පනේ | තුම්පනේ ගංඅට කොට්ඨාශයේ උප්පැන්න මරණ සහ තුම්පනේ කොට්ඨාශයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | 1451 සහ 2006.06.23 |
| මහනුවර | යටිනුවර | උඩුනුවර හා යටිනුවර කොට්ඨාශයේ අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | 1451 සහ 2006.06.23 |
| මහනුවර | උඩපලාත | ගම්පොල නගරය මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය | 1450 හා 2006.06.16 |
| මහනුවර | උඩපලාත | ගම්පොල ආඩියාකඩවත ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය | 1450 හා 2006.06.16 |
| මහනුවර | යටිනුවර | උඩුනුවර හා යටිනුවර කොට්ඨාශයේ දෙහිඅංග මුරුතලාව ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය | 1450 හා 2006.06.16 |

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය* | *ඉල්ලුම්පත් කැඳවූ කොට්ඨාශය සහ තනතුර* | *ගැසට් පත්‍රයේ අංකය සහ දිනය* |
|---|---|---|---|
| මහනුවර | කඩවත් සතර සහ ගඟවට කෝරළය | ගඟවට කෝරළය කොට්ටාශයේ උප්පැන්න මරණ සහ මහනුවර කොට්ඨාශයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර්ධුරය | 1400 සහ 2005.07.01 |
| මහනුවර | පස්බාගේ කෝරළය | නාවලපිටිය නගරය වෛද්‍ය රෙජිස්ට්‍රාර් ධූරය | 1400 සහ 2005.07.01 |
| මහනුවර | ගගඉහල කෝරළය | උඩපලාත කොට්ඨාශයේ උලපනේ ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය | 1398 සහ 2005.06.17 |
| මහනුවර | උඩුනුවර | උඩුනුවර හා යටිනුවර කොට්ඨාශයේ මීවලදෙණිය ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය | 1398 සහ 2005.06.17 |
| මහනුවර | උඩුනුවර | උඩුනුවර යටිනුවර කොට්ඨාසයේ පෙතියාගොඩ ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය | 1398 සහ 2005.06.17 |
| මහනුවර | කඩවත්සතර සහ ගඟවට | කඩවත් සතර සහ ගඟවට කෝරළය කොට්ඨාශයේ යටිනුවර ප්‍රදේශයේ අතිරේක විවාහ(උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | 1370 හා 2004.12.03 |
| මහනුවර | පාතහේවාහැට | මාරස්සන කොට්ඨාශයේ උප්පැන්න මරණ සහ පාතහේවාහැට කොට්ඨාශයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | 1328 හා 2004.02.13 |
| මහනුවර | එම | පාතහේවාහැට කොට්ඨාශයේ පිච්චමල්වත්ත ප්‍රදේශයේ අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | 1328 හා 2004.02.13 |
| මහනුවර් | හාරිස්පත්තුව | හාරිස්පත්තුව කොට්ඨාශයේ හිඟුල්වල ප්‍රදේශයේ අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | 1328 හා 2004.02.13 |
| මහනුවර | පූජාපිටිය | උඩගම්පහ අංක 01 කොට්ඨාශයේ උප්පැන්න මරණ සහ හාරිස්පත්තුව කොට්ඨාශයේ විවාහ(උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | 1318 හා 2003.11.28 |
| මහනුවර | කඩවත් සතර සහ ගඟවට කෝරළය | මහනුවර නගරය කොට්ඨාශයේ උප්පැන්න මරණ වෛද්‍ය රෙජිස්ට්‍රාර් ධූරය | 1307 හා 2003.09.19 |
| මහනුවර | පූජාපිටිය | හාරිස්පත්තුව කොට්ඨාසයේ ගල්හින්න ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය | 1241 සහ 2002.06.14 |
| මහනුවර | පාතහේවාහැට | පාතහේවාහැට කොට්ඨාශයේ උඩදෙනි ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය | 1241 හා 2002..06.14 |
| මහනුවර | පූජාපිටිය | හාරිස්පත්තුව කොට්ඨාශයේ බුළුගොහොතැන්න ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය | 1241 හා 2002.06.14 |
| මහනුවර | මිනිපේ | කන්දපහල දකුණ කොට්ඨාශයේ උප්පැන්න මරණ සහ උඩුදුම්බර කොට්ඨාශයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | 1235 හා 2002.05.03 |
| මහනුවර | උඩුනුවර | උඩුනුවර කඳුපලාත කොට්ඨාශයේ උප්පැන්න මරණ සහ උඩුනුවර හා යටිනුවර කොට්ඨාශයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | 1235 හා 2002.05.03 |
| මහනුවර | හාරිස්පත්තුව | පල්ලේගම්පහ දකුණ (අංක 01) කොට්ඨාශයේ උප්පැන්න මරණ සහ හාරිස්පත්තුව විවාහ(උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | 1235 හා 2002.05.03 |
| මහනුවර | පාතදුම්බර | පාතදුම්බර පල්ලේගම්පහ බටහිර කොට්ඨාශයේ උප්පැන්න මරණ සහ පාතදුම්බර කොට්ඨාශයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය. | 1235 හා 2002.05.03 |

07-63

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යාංශයේ වනිතා සංවර්ධන නිලධාරීන්ගේ පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2006

ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යාංශයේ වනිතා සංවර්ධන නිලධාරීන් සඳහා වූ පළමු වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2007 ඔක්තෝබර් මස කොළඹ දී පවත්වනු ලැබේ. මෙම විභාගය සඳහා අයදුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනය 2007 ජූලි මස 20 දින බවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. *විභාග පරිපාටිය.*—මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගය පහත සඳහන් විෂයන්ගෙන් සමන්විත වනු ඇත.

| | |
|---|---|
| විෂය අංක 01 - මුදල් රෙගුලාසි/කාර්යාල ක්‍රම | කාලය පැය 02යි, ලකුණු 100යි. |
| විෂය අංක 02 - ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා කාන්තා අයිතිවාසිකම් | එම |
| විෂය අංක 03 - සමාජ විද්‍යාව හා මනෝ විද්‍යා උපදේශනය | එම |

*සටහන*:-

(අ) සියලුම විෂයන් සඳහා එකම වාරයකදී හෝ වෙන් වශයෙන් වාර කිහිපයක දී හෝ පෙනී සිටීමට නිලධාරියෙකුට අවසර ඇත.

(ආ) සාමාර්ථය සඳහා සෑම ප්‍රශ්න පත්‍රයකින්ම ලකුණු 40%ක් හෝ ඊට වැඩියෙන් සෑම අපේක්ෂකයකුම ලබා ගත යුතුය.

03. *විෂයයන් .*–

(i) *මුදල් රෙගුලාසි/කාර්යාල ක්‍රම*

ශ්‍රී ලංකාවේ රාජ්‍ය කළමනාකරණ ව්‍යුහය
මූල්‍ය පාලනය හා වාර්ෂික ඇස්තමේන්තු
ආයතන සංග්‍රහයේ නියෝග හා මුදල් රෙගුලාසි
ආයතන සංග්‍රහයේ පහත සඳහන් පරිච්ඡේද ආවරණය කරනු ලැබේ.

I, II, IV, V, VII, IX, XII, XV, XXIII, XXVI, XXVII, XXX, XXXI, XXXII, XXXIII

ආණ්ඩුවේ මුදල් රෙගුලාසි 1 වැනි කාණ්ඩය (X පරිච්ඡේදය හැර)
කාර්යාල කළමනාකරණය

(ii) *ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා කාන්තා අයිතිවාසිකම්*

කාන්තාවන්ට එරෙහිව වෙනස්කම් කිරීම
ලාංකික සමාජයේ ස්ත්‍රී පුරුෂ සමාජ භාවය
ශ්‍රී ලංකා කාන්තා ප්‍රඥප්තිය හා කාන්තා හිමිකම්

(iii) *සමාජ විද්‍යාව හා මනෝ විද්‍යා උපදේශනය*

ග්‍රාමීය සමාජ විද්‍යාව
ශ්‍රී ලංකාවේ නාගරීකරණය
ශ්‍රම සංවර්ධනය
මනෝ විද්‍යා උපදේශනයේ මූලික ලක්ෂණ හා ආචාර ධර්ම
ස්ත්‍රිය සහ මානසික අක්‍රමිකතා
ශ්‍රී ලංකාවේ උපදේශන ව්‍යාපාරය හා උපදේශන අවස්ථා

04. මෙම පරීක්ෂණය සඳහා ඉල්ලුම් කිරීමේ ආදර්ශ අයදුම් පත්‍රයක් මෙම නිවේදනය අවසානයේ පළ කර ඇත. එම ආදර්ශ අයදුම්පත්‍රයට අනුව අපේක්ෂකයන් විසින් ස්වකීය අයදුම්පත්‍ර පිළියෙල කර ගත යුතුය. අයදුම්පත්‍ර පිළියෙල කර ගත යුත්තේ ඒ 4 ප්‍රමාණයේ කඩදාසියකය. අංක 01 සිට 06 දක්වා මුල් පිටුවේ ද සෙසු කොටස් දෙවන පිටුවේ වන ලෙසය. එය සම්පූර්ණ කළ යුත්තේ අපේක්ෂකයා විසින් සිය අත් අකුරිනි.

05. අයදුම්පත්‍ර තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් (ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙහි නම් ප්‍රාදේශීය ලේකම් මගින්) 2007 ජූලි මස 20 දින හෝ ඊට පෙර බත්තරමුල්ල, පැලවත්ත, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, විභාග කොමසාරිස් ජනරාල් වෙත ලියා පදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහා එවනු ලබන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතුය. විභාග සඳහා අයදුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනයට පසුව ලැබෙන හා අසම්පූර්ණ අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය පිළිබඳ කාර්යය සඳහා නව ප්‍රවේශක නිලධාරීන් විසින් තම අයදුම්පත්‍ර රාජ්‍ය භාෂාවෙන් හෝ තමන් සේවයට බඳවා ගන්නා ලද භාෂා මාධ්‍ය අනුව දෙමළ භාෂාවෙන්/ඉංග්‍රීසි භාෂාවෙන් හෝ පිළියෙල කොට ඉදිරිපත් කළ හැකිය.

06. අයදුම්පත්‍ර පිළිගෙන ඇති අපේක්ෂකයන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග කාල සටහනේ පිටපතක් සමග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කරනවා ඇත. ඒ හා සමගම විභාග පැවැත්වෙන දිනය සඳහන් පුවත්පත් දැන්වීමක් ද පළවනු ඇත. යම් කිසි විභාග අපේක්ෂකයෙකුට විභාගය පැවැත්වීමට අඩු වශයෙන් දින හතරකටවත් පෙර ප්‍රවේශ පත්‍රයක් නොලැබුණහොත් ඒ බැව් පහත සඳහන් විස්තර සමග බත්තරමුල්ල, පැලවත්ත, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, විභාග කොමසාරිස් ජනරාල්, (විදුලි පණිවුඩ ලිපිනය විභාග බත්තරමුල්ල) වෙත අප්‍රමාදව ලියා දැන්විය යුතුය.

i විභාගයේ නම :————.
ii අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.
iii සම්පූර්ණ ලිපිනය :————.
iv ඉල්ලුම්පත්‍රය තැපැල් කළ තැපැල් කාර්යාලය, ලියාපදිංචි අංකය සහ දිනය :————.

07. අනන්‍යතාව.- අපේක්ෂකයන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම විභාග ශාලාධිපතිට ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියවිලි අතුරින් කුමක් වුවත් භාර ගැනේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත,
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රයක් (පාස්පෝට් බලපත්‍රයක්)

ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කල නොහැකි අයදුම්කරුවකුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීම හෝ නොපිළිගැනීමට හෝ විභාග කොමසාරිස් ජනරාල්ට බලය ඇත.

08. *විභාග ගාස්තු.*– මෙම විභාගයට පෙනී සිටින අපේක්ෂකයන්ගෙන් පහත සඳහන් පදනම මත ගාස්තු අය කෙරේ.

| *විභාග ගාස්තු :* | *රු. ශත* |
|---|---|
| (අ) පළමුවන වතාව සඳහා ගාස්තු අය නොකෙරේ. | |
| (ආ) පළමුවන වතාවෙන් පසු සම්පූර්ණ විභාගය සඳහා | 115 00 |
| (ඇ) එක් විෂයයක් සඳහා | 75 00 |

අපේක්ෂකයාගේ අත්සන තබා නිසි පරිදි අවලංගු කල ආදායම් මුද්දර මගින් ගාස්තු ගෙවිය යුතුය.

09. මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, ඔහු විසින් විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් නියම කරන ලද නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් කෙරේ.

10. මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති සහ විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍රයක් නිකුත් කර ඇති තමන්ගේ දෙපාර්තමේන්තු/ කාර්යාලවල නිලධාරීන්ට විභාගයට පෙනී සිටීම සඳහා දෙපාර්තමේන්තු/ කාර්යාල ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු ලබා දිය යුතුය.

11. මෙම රෙගුලාසිවලට අඩංගු නොවූ යම් කරුණක් වෙතොත් ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යාංශයේ අභිමතය පරිදි ඒ ගැන ක්‍රියා කරනු ඇත.

ලේකම්,
ළමා සංවර්ධන හා කාන්තා
අභිවෘද්ධි අමාත්‍යාංශය.

2007 ජුනි මස 14 වැනි දින,
ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යාංශය,
අංක 177, නාවල පාර,
නාරාහේන්පිට.

[ ]
කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

අයදුම්පත්‍රය

**ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යාංශයේ වනිතා සංවර්ධන නිලධාරීන්ගේ පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2006**

First Efficiency Bar Examination 2006 for Women Development Officers of Ministry of Child Development And Women's Empowerment

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය [ ]

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාල අංකය කොටුව තුළ ලියන්න)

1. නම :

1.1 මුලකුරු සමග නම :————.
(මුලකුරු අගට යොදා (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
උදා. - SILVA, A. B.
1.2 මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.
(සිංහලෙන්/දෙමළෙන්)
1.3 ජාතික හැඳුනුම්පත් අංකය : [ | | | | | | | | | ]

2. කාර්යාලීය ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.1 කාර්යාලීය ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්)
2.2 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

3. ස්ත්‍රී/පුරුෂ භාවය 3.1 ස්ත්‍රී - 1 පුරුෂ - 0 [ ]

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.2 විවාහක/අවිවාහක බව
විවාහක - 1
අවිවාහක - 2 [ ]
(අදාල අංකය කොටුව තුළ ලියන්න)

3.3 උපන් දිනය : වර්ෂය : [ | | | ] මාසය : [ | ] දිනය : [ | ]

3.4 ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනට වයස : අවුරුදු : [ | ]
මාස : [ | ] දින : [ | ]

4. ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යාංශයේ වනිතා සංවර්ධන නිලධාරිනී තනතුරට පත් වූ දිනය :————. (නිත්‍ය වශයෙන් රාජකාරි භාර ගත් දිනය සඳහන් කළ යුතුය.)

5. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා ආදි ප්‍රවේශකයෙක් ද? නැතහොත් නව ප්‍රවේශකයෙක් ද? :————.

6. දෙපාර්තමේන්තුවේ නම (ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් නම් එම කාර්යාලයේ නම) :————.

7. ගැසට් නිවේදනයේ 2 වන ඡේදය යටතේ ඉදිරිපත් වන විෂයන් හා විෂය අංක :

| *විෂය* | *විෂය අංකය* |
|---|---|
| 01 ........................ | [ \| ] |
| 02 ........................ | [ \| ] |
| 03 ........................ | [ \| ] |

8. පරීක්ෂණයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට ද? :————.

9. ඉහත සඳහන් විස්තර නිවැරදි බව ද, ඉහත දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට මට හිමිකම් ඇති බව ද ප්‍රකාශ කරමි.

දිනය :————.

————,
අපේක්ෂිකාවගේ අත්සන

*සටහන.–* තමාගේ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියෙකුගේ තමාගේ ප්‍රාදේශීය ප්‍රධානියාගේ ඉදිරිපිටදී අයදුම්කරු අත්සන් කල යුතුය.

**අත්සන සහතික කිරීම**

මාගේ කාර්යාලයේ නිලධාරිනියක වූ, මා පෞද්ගලිකව දන්නා හඳුනන ...................................................... මෙය/මිය....................................දින මා ඉදිරිපිටදී අත්සන් කළ බව මෙයින් සහතික කරමි.

නම :—————.

පදවි නාමය :—————.

ලිපිනය :—————.

—————,
සහතික කරන්නාගේ අත්සන

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

i. ඉහත සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්, එවා නිවැරදි බවත්,
ii. අපේක්ෂිකාව මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු බවත් සහතික කරමි.

—————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව තැබිය යුතුයි.)

පදවි නාමය :—————.
දිනය :—————.

07-46

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන සංශෝධිත ගාස්තු

## 1995 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වේ.

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ.)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.

2. පෞද්ගලික පළකරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. කාර්යාල වේලාවන් පෙරවරු 9.00 සිට පස්වරු 4.45 දක්වා වේ.

4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.30 සිට පස්වරු 3.30 දක්වා බව සැලකිය යුතුයි.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපෑලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති තැනට එවිය යුතුය.

6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ටයිප් ගසා එවිය යුතුයි. අත් අකුරින් යුතු කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතෙකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1995 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේයි :-

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව | 51 | 0 |
| වැඩිවන සෑම අඟලකටම හෝ ඉන් කොටසකටම | 51 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | 504 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට | 1,008 | 0 |

(අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)

11. සෑම සිකුරාදා දිනයකම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. සෑම මාසයකම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.

13. 1995.01.01 දින සිට සංශෝධිත දායක ගාස්තුව* :-

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* - (වාර්ෂික)

| | මෙරට | | පිටරට | |
|---|---|---|---|---|
| | රු. | ශ. | රු. | ශ. |
| I වන කොටස සම්පූර්ණයෙන් (I, II, III ඡේද තුනම ඇතුළත්) | 1,612 | 0 | 2,098 | 0 |
| II වන කොටසේ සිට VI වන කොටස දක්වා එක කොටසක් | 572 | 0 | 745 | 0 |
| I වන ඡේදය | 520 | 0 | 1,007 | 0 |
| II වන ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර්, විභාග ආදිය) | 624 | 0 | 1,009 | 0 |
| III වන ඡේදය | 468 | 0 | 907 | 0 |
| අති විශේෂ ගැසට් පත්‍රය | 3,360 | 0 | 4,422 | 0 |

ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ 12 මාසයකට නොඅඩු කාලසීමාවකට පමණය.

*තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | | මිළ ගාස්තුව | | තැපැල් (මෙරට) | |
|---|---|---|---|---|---|
| | | රු. | ශ. | රු. | ශ. |
| (අ) | I වන කොටස | 31 | 0 | 5 | 0 |
| | II වන කොටසේ සිට VI වන කොටස දක්වා එක කොටසක් | 11 | 0 | 5 | 0 |
| (ආ) | I වන ඡේදය | 10 | 0 | 5 | 0 |
| | II වන ඡේදය | 12 | 0 | 5 | 0 |
| | III වන ඡේදය | 9 | 0 | 5 | 0 |

* දායක මුදල් භාරගැනීම සහ තනිපිටපත් විකිණීම භාර කොළඹ 01 ලෝටස් පාර, අංක 32හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

## ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනයද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා ගැසට් පත්‍රයට දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියළු දෙනාගේම පහසුවටද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ 01, ලෝටස් පාර, අංක 32හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙලින්ම ගෙවිය යුතුය.**

*සැලකිය යුතුයි.*- මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

### උපලේඛනය

| *මාසය* | *පළකිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2007** | | | |
| ජූලි | 2007.07.06 | සිකුරාදා | 2007.06.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.07.13 | සිකුරාදා | 2007.06.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.07.20 | සිකුරාදා | 2007.07.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.07.27 | සිකුරාදා | 2007.07.13 | සිකුරාදා | දහවල් | 12.00 |
| අගෝස්තු | 2007.08.03 | සිකුරාදා | 2007.07.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.08.10 | සිකුරාදා | 2007.07.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.08.17 | සිකුරාදා | 2007.08.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.08.24 | සිකුරාදා | 2007.0810 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.08.31 | සිකුරාදා | 2007.08.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| සැප්තැම්බර් | 2007.09.07 | සිකුරාදා | 2007.08.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.09.14 | සිකුරාදා | 2007.08.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.09.21 | සිකුරාදා | 2007.09.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.09.28 | සිකුරාදා | 2007.09.14 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.